තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිට දී ය

# එම්. ජගත් කීර්ති එ. ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

RTIC Appeal (පුද්ගලික වශයෙන් විභාග කිරීම)/ 1120/2019 (2019.10.21 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍රන්
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

අභියාචක - **එම්. ජගත් කීර්ති**
නොතිසි ලත් පාර්ශවය - නම් කළ නිලධාරී, **ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව**

**පෙනීසිටීම**

අභියාචක - **එම්. ජගත් කීර්ති**
පොදු අධිකාරිය - ආර්. කරුණාරත්න
ආර්.ජයසේකර, නීති නිලධාරී
ආර්.නදීක
ආර්.පරණවිතාන,,

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2018/09/05, 2018/10/04 |
| තොරතුරු නිළධාරියා තීරණය ලබා දුන් දිනය | 2018/09/27 |
| නම් කල නිළධාරියා වෙත අභියාචනය යොමු කළ දිනය | 2018/11/24 |
| නම් කල නිළධාරියා තීරණය ලබා දුන් දිනය | ප්‍රතිචාරයක් නොමැත |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2019/01/27 |

**අභියාචනයට පසුබිම්වූ කරුණු**:

අභියාචක විසින් 2018/09/05 සහ 2018/10/04 දිනැති තොරතුරු ඉල්ලීම් මඟින් පහත තොරතුරු ඉල්ලා සිටින ලදි.
05/09/2018 දිනැති තොරතුරු ඉල්ලීම

ඔබගේ ලිපි ගොනු අංක 19/18 සබැදියි.

2. 2018.02.04 දින අකුරැස්ස මිනින්දෝරු කාර්යාලයේ සේවය කරන මිනින්දෝරු මධුෂිකා මහත්මිය ඇතුළු සේවක පිරිසක් පැමිණ අභියාචකගේ ඉහල අතුරලියේ පිහිටි පාලුවත්ත ඉඩම අකුරලිය ප්රාදේශීය ලේකම්ගේ මිනුම් නියෝගයක් මත පළමුවරට මැනුම් කටයුතු සිදු කරන ලදී.

3. ඉන් මාස කිහිපයකට පසු නැවතත් එම මහත්මිය සහ සේවක පිරිස පැමිණ අභියාචකගේ ඉඩමේ දෙවැනි වරටත් මිනුම් කටයුතු සිදු කරන ලදී. මෙම මිනුම් දෙකට අදාළ පහත සඳහන් තොරතුරු අභියාචකට දැන ගැනීමට අවශ්යව ඇත.

(a) 2018.02.14 දින සිදු කළ පළමු මිනුම සඳහා අතුරලිය ප්රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඔබ දෙපාර්තමේන්තුව වෙත එවන ලද ඉල්ලීම් ලිපියේ පිටපතක් සහ එම ලිපිය සමග එවන ලද ලේඛණවල පිටපත්

(b) මෙම මිනුම් සඳහා ඔබ දෙපාර්තමේන්තුව උපයෝගී කර ගත් ලේඛණ සිතියම් මොනවාද? එම ලේඛන සිතියම්වල පිටපත්

(c) මෙම මිනුම සඳහා ඉහළ අතුරලිය ග්රාම නිලධාරිනිය ඉදිරිපත් කළ ලේඛන සිතියම් මොනවාද?ඒවායේ පිටපත්

(d) දෙවන වරටත් මිනුම් කටයුතු සිදු කළේ කුමන ගැටළුවක් නිසාද?

(e) ඒ ගැටලුව සඳහා අදාළ අය ඉදිරිපත් කළ ලිපි ලේඛන සිතියම් වල පිටපත්

(f) අභියාචකගේ ඉඩමේ මිනුම් කටයුතු සිදු කරන කාල පරිච්ඡේදයේ ඔබ ආයතනයත් අතුරලිය ලේකම් කාර්යාලය අතර හුවමාරු ලිපි ලේඛන හා ඒ සඳහා ලැබුණු පිළිතුරු ලිපි ලේඛනවල පිටපත්

(g) මිනුම් කටයුතු අවසන් කර ඔබ ආයතනයෙන් අතුරලිය ප්රාදේශීය ලේකම්ට යවන ලද මිනුම් වාර්තාවේ පිටපතක්

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිට දී ය

04/10/2018 දිනැතිතොරතුරුඉල්ලීම

අභියාචකගේ අංක MR/AKR/2018/19 2018.06.21 දිනැති මිනින්දෝරු වාර්තාව සබැඳිය.

2. එම වාර්තාවේ ඡේද අංක 03හි සඳහන් කර ඇති පරිදි කොට්ඨාශ අංක 314 ඉහළ අතුරලිය ග්‍රාම නිලධාරී ඒ. අයි. අමරදිවාකර මහත්මිය සහ ඉඩමේ වර්තමාන හිමිකරු වන එම්.ඩී. ජගත් කීර්ති වන අභියාචක විසින් පෙන්වා දෙන ලද මායිම්වලට අනුව ක්ෂේත්‍ර පරීක්ෂාවෙන් පසු මැනුම් කටයුතු සිදු කර ඇත.

3. වාර්තාවේ අංක 5 ඡේදයේ විස්තර කර ඇති පරිදි අභියාචක විසින් කේ. එල්.වී. මධුෂිකාමිනින්දෝරු මහත්මියට ලබා දුන්නේ පාලුවත්තඉඩමේ වර්තමාන පිඹුරසහ ඔප්පුව ඊට අදාළ ඉඩමේ මායිම් වල තොරතුරු පමණි.
4. වාර්තාවේ ඡේදඅංක 4හි සඳහන් කර ඇති මාතර දිසා අධිකරණයේ නඩු අංක 6564 බලයලත් මිනින්දෝරු පර්ඩිනන්ඩ් මහතාගේ අංක 17/5 හා1939.07.01 දිනැතිපිඹුරග්‍රාම නිලධාරී විසින් ඉදිරිපත් කර ඇත.

අදාළ වාර්තාවේ සටහන් වී ඇති කරුණුවලට අදාළ පහත සඳහන් තොරතුරු අභියාචක හට අවශ්‍ය වී ඇත.

a) අංක 314 ඉහළ අතුරලිය ග්‍රාම නිලධාරී ඒ . අයි.අමරදිවාකර මහත්මිය විසින් ඉදිරිපත් කර ඇති අංක 17/5 හා 1939.07.01 දිනැති පිඹුරේ පිටපතක්
b) 17/5 හා1939.07.01 දිනැති ග්‍රාම නිලධාරී විසින් ලබාදුන් මෙම පිඹුරසත්‍ය ලේඛනයක් ලෙස ඔබ ආයතනය අනුමත කරනවාද
c) රජයේකුමන ආයතනයකින් එම ලේඛනයේ සත්‍ය පිටපතක් ලබාගත හැකිද
d) එම ලේඛනය භාවිතා කරමින් මිනුම් කටයුතු කළේ කුමන ඉඩමද
e) ඡේද අංක 6 හි සඳහන් රිදී දියවන පෞද්ගලික ඉඩමක් ලෙස හඳුනාගෙන ඇති අතර එහි මායිම් මොනවාද බිම් ප්‍රමාණය කොපමණද
f) අංක 6 හි සඳහන් අංකATU/LND/01/DO/55 සහ 2018. 6. 20 දිනැති ලිපියේ පිටපතක්

තොරතුරු නිලධාරියා 2018/09/27 හා 2018.10.4 දිනැතිව පිළිතුරු සපයමින් පහත කරුණු සපයන ලදී.

2018.9.5 දිනැති තොරතුරු ඉල්ලීම හා බැඳේ.
a) ප්‍රාදේශීය ලේකම් අතුරලිය මගින් ලබාගන්න
b) A 1806. හි පිටපත් අවශ්‍යනම් කාර්යාලයට පැමිණ මුදල් ගෙවීමෙන් පසු ලබාගත හැකිය

c) ග්‍රාම නිලධාරී විසින් ලබාදී ඇති ලේඛන මොනවාද යන්න අපගේ ගොනු වී ඇති තොරතුරු අනුව තහවුරු කල නොහැක.
d) මැනුමේ අවශ්‍යතාවය මත දෙවන වරටත් මැනුම් කටයුතු සිදු කරන ලදී.
e) -
f) ලේඛන හුවමාරුවක් සිදු නොවුණු අතර මේ සම්බන්ධව ලිපි අතුරලිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගන්න
g) ප්‍රාදේශීය ලේකම් අතුරලිය මගින් ලබාගන්න

2018.10.4 දිනැති තොරතුරු ඉල්ලීම හා බැඳේ.

a) පුද්ගලික මිනුම් කටයුතු සම්බන්ධ ලේඛන අප දෙපාර්තමේන්තුව සතුව නොමැත
b) බලයලත් මිනින්දෝරුවරුන්ගේ පිඹුරු සම්බන්ධව අපට කිසිවක් කිව නොහැක
c) මිනින්දෝරු මහතුන්ගේ පිඹුරු අපගේ ආයතනයෙන් ලබාගත නොහැක.
d) ඔබ විසින් එවන ලද මිනින්දෝරු වාර්තාවේ අංක3 ඡේදයෙහි සඳහන්වේ.
e) මැන ඇති පිඹුරේ සහ ඉඩම් විස්තර ලැයිස්තුවේ සඳහන්වේ.
f) ප්‍රාදේශීය ලේකම් අතුරලිය මගින් ලබාගන්න

මෙම ප්‍රතිචාරයෙන් අතෘප්තියට පත් අභියාචක විසින් 2018/11/24 දිනැතිව නම් කළ නිලධරයා වෙත අභියාචනයක් යොමු කරන ලදී. නම්කළ නිලධාරයා පනත ප්‍රකාරව, නියමිත කාලය තුළ ප්‍ර තිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2019/01/27 දිනැතිව කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

## අභියාචනය සලකා බලන අවස්ථාවේදී උද්ගතවූ කාරණා:

පාර්ශව දෙකම සහභාගී වී ඇත. නොලැබුණු තොරතුරු පිළිබඳව විමසන ලදී. අභියාචක විසින් පොදු අදධිකාරිය සතු අංක MR/ATR/2018/19 දරණ ගොනුව පරීක්ෂා කොට අවශ්‍ය ලේඛන 11 ලකුණු කරන ලදී.

## නියෝගය:

ලකුණු කරන ලද ලේඛන වල සහතික පිටපත් අභියාචක වෙත නිකුත් කරන ලෙස කොමිසම පොදු අධිකාරියට නියෝග කරන ලදී. ඒ අනුව අදාළ2 සහතික පිටපත් අභියාචක වෙත ලබා දෙන ලදී.
අභියාචනය අවසන් කරනු ලැබේ.

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යපටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කිරීමට නියෝග කර සිටිමු.